Article 12(1)
Article 11

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2018/02/27 |

පැමිණිලිකරු : කේ.ආර්.පී.කේ ප්‍රනාන්දු මයා.
නො : 198. ජයවීර ටයර් ට්‍රේඩර්ස්.
නව ගුවන්තොටුපොල හන්දිය.
කොළඹ පාර. කටුනායක.

වගඋත්තරකරුවන් : ස්ථානාධිපති.
පොලිස් ස්ථානය.
සීදූව.

**<u>පැමිණිලි අංකය : HRC/1097/11</u>**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2011.03.16 වන දින නාඳුනන පුද්ගලයින් හය දෙනකු තම ව්‍යාපාරික ස්ථානයට කඩාවැදී තමා 'ඩිනාල් සභාපතිතුමාට විරුද්ධව කොළ බෙදනවාදැයි' විමසා පහත් අන්දමින් පරුෂ වචනයෙන් බැණ පහරදී තමාව බලෙන් ඔසවා වාහනයකට දමා ගත් බවත් පසුව යම් කෙනෙකුගේ දැනුම්දීමක් අනුව තමාව පොලීසිය වෙත ගෙන ආ බවත්. එහිදී තමාව මෙසේ පැහැරගෙන යාමට අණදුන් එ.ජා.නි.ප සන්ධාන අපේක්ෂක ඩිනාල් පෙරේරා යන අය පැමිණ තමාට කැලෑ පත්‍ර බේදීම පිළිබඳව තර්ජණය කරන ලද බවත් දක්වා ඇත.

පසුව ඔහු පොලිස් ස්ථානය තුළට ගිය බවත් ඉන් අනතුරුව තමාද ස්ථානයට කැඳවාගෙන ගිය අතර ස්ථානාධිපති එහි සිටි බවත් ඔහු ඉදිරියේ තමාට එ.ජා.නි.ප අපේක්ෂක ඩිනාල් පෙරේරා කැලෑ පත්තර ගැසීම පිළිබඳව චෝදනා කළ බවත් ඒ සම්බන්ධව නීතිමය පියවර ගන්නා ලෙස ඔහු ස්ථානාධිපතිට දැන්වූ බවත් එම පත්‍රිකා තම කාර්යාලයට ගෙනවිත් තැබූ පුද්ගලයාද අපේක්ෂකයෙකු වන බැවින් ඔහුව ගෙන්වීමට දැන්වුවද වගඋත්තරකාර පාර්ශවය ඒ කිසිවක් නොකළ බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත. එසේම තම බිරිඳ ඒ අවස්ථාවේ තමාව පැහැරගෙන යාම සම්බන්ධව පැමිණිලි කිරීමට පොලිස් ස්ථානයට පැමිණි බවද තමාව 2011.03.16 දින පහරදී පැහැරගෙන යාම සම්බන්ධව ඒ


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk

අවස්ථාවේ පැමිණිල්ලක් සිදුකළද වගඋත්තරකාර පාර්ශවය ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවද, වගඋත්තර පාර්ශවය පහරදුන් පාර්ශවයට පක්ෂව කටයුතු කළ බවද ඒ අනුව තමාට නීතියේ රැකවරණය සර්වසාධාරණව නොලැබුනු බවද පැමිණිල්ල මගින් වැඩිදුරටත් දක්වා ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

2011.05.23 දාතම වාර්තාව අනුව වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ පැමිණිලිකරු විසින් නාඳුනන පුද්ගලයින් සිදුකළ පහරදීමක් සම්බන්ධව පැමිණිලි කළ බවත් එම පැමිණිල්ලට අදාළ සැකකරුවන් 2011.04.04 වන දින අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බවත් පසුව ඔවුන් රක්ෂිත බන්ධනාගාරගත කළ බවත්ය.

2012.01.17 දිනැති පරීක්ෂණයේදී වගඋත්තරකරු වෙනුවට සහභාගී වූ නියෝජිත විසින් සඳහන් කර ඇත්තේ 2011.03.16 වන දින මෙම පැමිණිලිකරු විසින් පැමිණිල්ලක් කළද, 2011.04.04 දක්වා පැමිණිල්ලට අදාළ වගඋත්තරකරුවන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූයේ එය මැතිවරණ රාජකාරී කාලයක් වීම හේතුවෙන් වන බවයි.

විමර්ශනය :-

පැමිණිලිකරු මූලිකවම කොමිෂන් සභාවේ පැමිණිලිකර ඇත්තේ, හිටපු ප්‍රාදේශීය සභා සභාපති විසින් මැර පිරිසක් යොදවා තම ව්‍යාපාරික ස්ථානයට ඔවුන් එවා තමාට පහරදී පැහැරගෙන ගොස් පොලිස් ස්ථානයට භාරදුන් බවත්, එහිදී තමා පැහැරගැනීම හා පහරදීම පිළිබඳව පොලීසියට පැමිණිලි කළද වගඋත්තර පාර්ශවය ඒ පිළිබඳව නිසියාකාරව ක්‍රියාත්මක නොවූ බවය.

මෙහිදී පැමිණිලිකරු ප්‍රාදේශීය සභාවේ සභාපති වගඋත්තරකරුවෙකු ලෙස නම් කර තිබුනද, සිද්ධිය වන විට ප්‍රාදේශීය සභාව විසුරුවා තිබීමත් එම වගඋත්තරකරු විධායක හා පරිපාලනමය ක්‍රියාවට වගකියනු නොලැබීමත් මත මෙම පැමිණිල්ලේ වගඋත්තරකරුවෙකු ලෙසට නම් කළ නොහැකි බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ පැමිණිල්ලේ දක්වන ආකාරයට ඔහුට පහරදී පැහැරගෙන ගොස් පොලිස් ස්ථානයට භාරදීමත් එහිදී පැහැරගත් පුද්ගලයන් සම්බන්ධව පොලිස් ස්ථානය ක්‍රියාත්මක නොවීමත් හේතුවෙන් තමාට අගතියක් කළ බවට දක්වා ඇති කාරණය පිළිබඳ කොමිෂන් සභාවේ අවධානය යොමු කර ඇත.

ඒ අනුව අදාළ පරීක්ෂා කිරීමේදී පැමිණිලිකරු විසින් සිද්ධිය වූ දිනම එනම්, 2011.03.16 MOIB-54/121 යටතේ නාඳුනන පුද්ගලයන් පත්‍රිකා පිළිබඳව විමසා තමාට පහරදී පොලීසිය වෙත ගෙන ගිය බවත් හිටපු ප්‍රාදේශීය සභාවේ සභාපති වූ ඩිනාල් පෙරේරා යන පුද්ගලයා පොලීසිය අසලදී හමු

වී තමාව මැරිය යුතු බව පවසා පොලීසියට ගිය බවත් පසුව තමාට පහරදුන් පුද්ගලයන් තමාව පොලීසිය තුළට ගෙන ගිය බව දක්වා ඇත.

එම පැමිණිල්ලට අදාළව සැකකරුවන් 2011.04.04 වන දින අත්අඩංගුවට ගෙන ඇති බව MOIB – 1 37/30 සටහන් අනුව තහවුරු වී ඇත. එසේම 2011.04.04 වන දින සැකකරුවන් මහේස්ත්‍රාත්වරයා වෙත බී 94/11 යටතේ ඉදිරිපත් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් පොලිස් ස්ථානයේ සිදුකර ඇති පැමිණිල්ලට අදාළව සති 02 කට පසු පොලීසිය ක්‍රියාත්මක වී ඇති බව නිරීක්ෂණය වේ. එසේම පැමිණිලිකරු විසින් පොලිස් ස්ථානයට ලබා දුන් පැමිණිල්ලේ හිටපු ප්‍රාදේශීය සභාපති වන ඩිනාල් පෙරේරා. පොලිස් ස්ථානයේදී තර්ජණය කළ බව දක්වා ඇත. නමුත් පැමිණිල්ලේ සඳහන් එම පුද්ගලයා පිළිබඳව පැමිණිල්ලට අදාළව කිසිදු විමර්ශනයක් සිදුකර නොමැති බව නිරීක්ෂණය වේ.

හිටපු සභාපති ඩිනාල් පෙරේරා මහතා මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයට කැඳවා ඇති අතර එහිදී තමාට විරුද්ධව පැමිණිලිකරු පත්‍රිකා බෙදා හැරීමේදී තම පාක්ෂිකයන් විසින් ඔහුව අල්ලා පොලිස් ස්ථානයට ඉදිරිපත් කර තමාට දුරකථන ඇමතුම් ලබා දීමෙන් පසු ස්ථානයට පැමිණි බව දක්වා ඇත. ඒ අනුව මෙම පැමිණිලිකරු ස්ථානයට ඉදිරිපත් කිරීමට මෙම පුද්ගලයා සම්බන්ධ වූ බව එම ප්‍රකාශයෙන් තහවුරු වේ.

ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය එම පුද්ගලයා සම්බන්ධව පැමිණිල්ලට අදාළව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ අනුව 35 වගන්තිය අනුව "පෞද්ගලික තැනැත්තන් විසින් තමා ඉදිරිපිටදී සංඥය වරදක් කරන හෝ වරදකරුවෙකු ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබ සිටින හෝ පැන දුවන්නා වූ සංඥය වරදක් කළ තැනැත්තෙකු යැයි සාධාරණව තමා සැක කරන්නා වූද යම් තැනැත්තෙකු සිර භාරයට ගත හැකි අතරම එම තැනැත්තා අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ආසන්නතම නිලධාරියා වෙත භාරදිය යුතු ලෙස" දක්වා ඇත.

"එම තැනැත්තා 32 වගන්තියේ විධිවිධාන යටතට පත් වන්නකු බව විශ්වාස කිරීමට හේතු පවතී නම් සෑම නිලධාරියෙකු විසින් ඔහු නැවත සිර භාරයට ගත යුතු අතර සිදුකර ඇතැයි විශ්වාස කිරීමට හේතු නොමැති නම් ඔහු වහාම නිදහස් කළ යුතුයි" ලෙසට ප්‍රතිපාදන ලබා දී ඇත.

නමුත් පෞද්ගලික තැනැත්තෙක් නිලධාරියා වෙත පැමිණිලිකරුව භාරදුන් බවට එම පෞද්ගලික තැනැත්තා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදීද පිළිගෙන ඇත. නමුත් වගඋත්තරකාර පාර්ශවය විසින් උක්ත ප්‍රතිපාදන අනුව ක්‍රියාකර නොමැති බව නිරීක්ෂණය වන්නේ එම පහරදීමට අදාළව කිසිදු කටයුත්තක් කළ බවට ලිඛිත සාක්ෂි කොමිෂන් සභාවට සැපයීමට අපොහොසත් වීමෙනි. එසේම පැමිණිලිකරු විසින් සිදුකළ පැමිණිල්ලද එකම සිද්ධියකට අදාළ

බැවින් වගඋත්තරකාර පාර්ශවය විසින් අදාළ පැමිණිලි එකට විභාග කිරීමෙන් ඒ පිළිබඳව කටයුතු කිරීමේ හැකියාව පැවැති බව පෙනී නමුත් වගඋත්තරකාර පාර්ශවය එළෙස ක්‍රියාකර නොමැති බව නිරීක්ෂණය වේ. පහරදුන් තැනැත්තන් විසින් පැමිණිලිකරුට සිදුකළ පහරදීම පිළිබඳව අවධානයට ලක්කර නොමැති බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඒ අනුව මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලිකරු විසින් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කරන ලද 'තමාව පැහැරගෙන ගොස් පහරදීම පිළිබඳව' කළ පැමිණිල්ල නිසි උද්යෝගයෙන් හා අප්‍රමාදීව විමර්ශනය නොකර ඇති අතර. මැර කණ්ඩායමකට නීතිය අතටගෙන ක්‍රියා කිරීමට අවස්ථාවක් වක්‍රව ලබා දීමට වගඋත්තරකරුවන් විසින් කටයුතු සිදුකළ බවද නිරීක්ෂණය වේ. ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති නීතියේ ආරක්ෂණය සර්ව සාධාරණය පැමිණිලිකරු වෙත ලැබී නොමැති බව කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු වෙත රු. 10,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

2. මේ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙතද යොමු කිරීමට නියමිතය.

2018.03.21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha